# මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

(ශ්‍රී ලංකා පොලිසිය)

# ලංසු කැඳවීම (IFB)

## ශ්‍රී ලංකා පොලිසිය සඳහා 250cc යතුරුපැදි 750 ක් මිලදී ගැනීම

## ලංසු අංකය.: MPS/03/PB/PR/07/54/2025

1. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, 18 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාවේ ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවේ (HLPC) සභාපති විසින් ශ්‍රී ලංකා පොලිසිය සඳහා 250cc යතුරුපැදි 750 ක් මිලදී ගැනීම වෙනුවෙන් සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. ජාතික තරඟකාරී ලංසු තැබීමේ (NCB) ක්‍රමවේදය යටතේ, තනි අදියර - තනි කවර ක්‍රමයට (Single stage one Envelope Method) මෙම ලංසු තැබීම සිදු කෙරේ.

3. ප්‍රසම්පාදන උපලේඛනය

| ප්‍රසම්පාදනයේ නම | ලංසු ඇපකරයේ වටිනාකම | ආපසු නොගෙවන ලේඛන ගාස්තුව | ලංසු භාරගැනීමේ අවසන් දිනය | පූර්ව ලංසු රැස්වීම |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා පොලිසිය සඳහා 250cc යතුරුපැදි 750 ක් මිලදී ගැනීම. | රු. 9,000,000.00 | රු. 86,000.00 | 2026.01.12 දින පැය 14.00ට | 2025.12.29 දින පෙ.ව 11.00 ට, ශ්‍රී ලංකා, බත්තරමුල්ල, සුහුරුපාය, 17 වන මහල, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේදී. |

4. මේ පිළිබඳ උනන්දුවක් දක්වන සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ට, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත 011 2887697 අංකය ඔස්සේ හෝ **mops.procurementunit@gmail.com** විද්‍යුත් තැපෑල ඔස්සේ සම්බන්ධ වීමෙන් වැඩිදුර තොරතුරු ලබා ගත හැක. එසේම, වැඩ කරන දිනවල **පෙ.ව. 09.00 සිට පැය 15.00 දක්වා සුහුරුපාය, 17 වන මහල, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව** යන ලිපිනයෙන් හෝ අපගේ නිල වෙබ් අඩවිය **(www.pubsec.gov.lk)** හරහා ලංසු භාරගැනීම අවසන් වන දිනය දක්වා ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැක.

5. ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කර ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක්, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත (17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල) ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් සහ ආපසු නොගෙවන ලේඛන ගාස්තුව මුදලින් ගෙවීමෙන් පසු **2025.12.19 දින සිට 2026.01.09 දින** දක්වා කාලය තුළ මිලදී ගත හැක.

6. ලංසු 2026.05.10 දින දක්වා වලංගු විය යුතුය. සියලුම ලංසු සමඟ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද, 2026.06.07 දින දක්වා වලංගු, රුපියල් මිලියන නවයක (රු. 9,000,000.00) ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.

7. 1987 අංක 03 දරන රජයේ පොදු කොන්ත්‍රාත් පනතට අනුකූලව, ටෙන්ඩර්කරු, නියෝජිතයා, උප නියෝජිතයා හෝ ටෙන්ඩර්කරු වෙනුවෙන් පෙනී සිටින ඕනෑම නම් කරන ලද පුද්ගලයෙකු අවශ්‍ය ලියාපදිංචිය නිසි පරිදි සම්පූර්ණ කර තිබිය යුතුය.

8. සම්පූර්ණ කරන ලද ලංසු, **2026.01.12 දින පැය 14.00 ට** හෝ ඊට පෙර, **මුදල් අංශය (Finance Division), මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ, සුහුරුපාය, 17 වන මහල, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව** වෙත භාර දීම හෝ එහි තබා ඇති පෙට්ටියක තැන්පත් කිරීම සිදු කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, පැමිණීමට කැමති ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ ඉහත ලිපිනයේ දීම ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති,**
**ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව (HLPC),**
**මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,**
**18 වන මහල, සුහුරුපාය,**
**බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.**
**2025.12.19**

SELACINE